# “ වැරදි ඇත්නම් නිවැරදි කරන්නටයි ”

## සුබසාධක ප්‍රතිලාභ ලැබීම පිණිස සුදුසු තැනැත්තන්/පවුල් හඳුනාගැනීම - 2022

### සුදුසුකම්ලාභීන්ගේ නාම ලේඛනය ප්‍රසිද්ධ කිරීම

2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ 9 වන වගන්තිය අනුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබී ඇති **"අස්වැසුම"** සුබසාධක යෝජනා ක්‍රමය යටතේ 2022 වර්ෂයේ ආරම්භ කළ වැඩසටහන මඟින් සුබසාධක ප්‍රතිලාභ දීමනා ගෙවීම් සඳහා තෝරා ගෙන ඇති සුදුසුකම්ලාභීන්ගේ නම් ලැයිස්තුව 2023 ජූනි 20 වන දින සිට ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඒ අනුව **www.wbb.gov.lk** සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ නිල වෙබ් අඩවියේ ඇති **"අස්වැසුම"** සුදුසුකම්ලාභීන්ගේ නාම ලේඛනය 2022" මෙනුවට ඇතුළත් වී, දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ/ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් සඳහන් කර ඇති සුදුසුකම්ලාභීන්ගේ නම් ලැයිස්තුව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම ඔබට දැකබලා ගැනීමට හැකිය.

එමෙන්ම ඔබ පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහ ගම් මට්ටමින් ඇති අනෙකුත් රජයේ කාර්යාලවල මෙම සුදුසුකම්ලාභීන්ගේ නාම ලේඛණය ප්‍රදර්ශණය කරනු ලැබේ.

### විරෝධතා/හිමිකම්පෑම් (අභියාචනා) බාරගැනීම

සුබසාධක ප්‍රතිලාභ පනතේ 11 (1) වගන්තිය අනුව සුදුසුකම්ලාභීන්ගේ නම් ලැයිස්තුවේ ඇතුළත් නම් වලට විරෝධතා/හිමිකම්පෑම් (අභියාචනා) කැඳවීමට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය තීරණය කර ඇත. ඒ අනුව අභියාචනාකරුවන්ට සහ උනන්දුවක් දක්වන පුරවැසියන්ට තම විරෝධතා/හිමිකම්පෑම් (අභියාචනා) ගොනු කළ හැක.

තොරතුරු සංගණනයට භාජනය වූ සියලුම ඉල්ලුම්කරුවන්ට තමා ලබාදුන් තොරතුරු සහ එහි නිවැරැදිභාවය **www.wbb.gov.lk** වෙබ් අඩවියේ **"අයදුම්කරුවන්ගේ සංගණනය තොරතුරු"** මෙනුවට පිවිස නැවත පරීක්ෂා කර බැලිය හැක. එම තොරතුරු වල වැරැද්දක් හෝ වෙනස්කමක් තිබේ නම් ඒ අනුව පහත දැක්වෙන පරිදි සිය හිමිකම්පෑම් (අභියාචනා) ඉදිරිපත් කළ හැක.

- **විරෝධතා**
  සුදුසුකම්ලාභීන්ගේ නම් ලැයිස්තුවේ ඇතුළත් තැනැත්තෙකු විසින් සපයා ඇති තොරතුරුවල අසත්‍යතාවයන් පවතින බව නිරීක්ෂණය කරනු ලබන ඕනෑම තැනැත්තෙකුට සිය විරෝධතාවය දැක්විය හැකිය.
- **හිමිකම්පෑම් (අභියාචනා)**
  මෙම වැඩසටහන සඳහා මූලික අයදුම්පතක් ඉදිරිපත්කර තොරතුරු සංගණනයට භාජනය වූ එහෙත් එම සංගණනයේදී ලබා දී ඇති තොරතුරුවල වැරැද්දක්/වෙනස්කමක් තිබෙන බවට හැඟියන සහ සුදුසුකම්ලාභීන්ගේ නම් ලැයිස්තුවේ තම නම සඳහන් වී නොමැති ඉල්ලුම්කරුවන්ට

  සහ

  වැඩසටහන සඳහා මූලික අයදුම්පතක් ලබාදුන් නමුත් තම නිවසට සංගණන නිලධාරියෙකු පැමිණ නැති අවස්ථාවක් වේ නම් හෝ දත්ත පද්ධතියට ඇතුළත් වී නොමැති නම් එවන් ඉල්ලුම්කරුවන්ටද හිමිකම්පෑමක් (අභියාචනා) කිරීමට හැකිය.

### විරෝධතා/හිමිකම්පෑම් (අභියාචනා) ඉදිරිපත් කරන ආකාරය

- **විරෝධතා/හිමිකම්පෑම් ඉදිරිපත් කිරීම පහත සඳහන් කුමන හෝ ආකාරයකින් 2023 ජූනි 30 වන දිනට පෙර සිදු කළ යුතුය.**

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ **www.wbb.gov.lk** වෙබ් අඩවියට ඇතුළත් වී විරෝධතා/අභියාචනා පෝරමයට පිවිසෙන්න. ඉන්පසු දැන්වීමේ සඳහන් ආදර්ශ අයදුම්පතට සමාන **ඉලෙක්ට්‍රොනික අයදුම්පතට** ඔබගේ ඉල්ලීම ඇතුළත් කරන්න.

ඔබගේ විරෝධතා/හිමිකම්පෑම් (අභියාචනා) ආදර්ශ අයදුම්පතට අනුව සකස් කර ඔබ පදිංචි **ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට** ගෙනවිත් බාරදෙන්න.

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය **1924 ක්ෂණික ඇමතුම් අංකය** අමතා ඔබගේ විරෝධතා/හිමිකම්පෑම් (අභියාචනා) ඉදිරිපත් කිරීම පිළිබඳ උපදෙස් ලබා ගත හැකිය.

### බැංකු ගිණුම් විවෘත කිරීම

ප්‍රතිලාභ දීමනා ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම් වලට සෘජුව බැර කළ යුතු බැවින් දැනටමත් මූලික තේරීම් නාම ලේඛනයේ සිටින බැංකු ගිණුම් නොමැති සුදුසුකම්ලාභීන් ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ හෝ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ගිණුමක් විවෘත කිරීම සඳහා පියවර ගත යුතුය.

- පළමු අදියර යටතේ සුබසාධක ප්‍රතිලාභ දීමනා සෘජුවම බැංකු ගත කරනු ලබන්නේ විරෝධතා/හිමිකම්පෑම් (අභියාචනා) ඉදිරිපත් වී නොමැති සුදුසුකම්ලාභීන්ටය.

tamilguru.lk

#### විරෝධතා/හිමිකම්පෑම් (අභියාචනා) ඉදිරිපත් කිරීමේ ආදර්ශ අයදුම්පත

(සුබසාධක ප්‍රතිලාභ පනතේ 11 වන වගන්තිය අනුව)

1.0. ඉදිරිපත් කරන පැමිණිල්ලේ ස්වභාවය :-
(අදාළ පිළිතුර ඉදිරියේ ✓ ලකුණ යොදන්න)

| | |
|---|---|
| විරෝධතා | |
| හිමිකම්පෑම් (අභියාචනා) | |

1.1. සම්පූර්ණ නම :-
(හිමිකම්පාන්නා/විරෝධතාකරු/පුරවැසි)

1.2. ගෘහ ඒකක අංකය :-
(හිමිකම්පාන්නා/විරෝධතාකරු)

1.3. ජාතික හැඳුනුම්පත් අංකය :-
(විරෝධතාකරු/පුරවැසි)

1.4. ලිපිනය :-
(විරෝධතාකරු/පුරවැසි)

1.5. දුරකථන අංකය :-
(දැනුම්දීම් සහ වැඩි විස්තර ලබාගැනීමට)

1.6. හිමිකම්පාන්නා විසින් ලබා දී ඇති තොරතුරු වල වැරදි/වෙනස්කම් තිබේ නම් ඒවා නිවැරදි කර ඇතුළත් කරන්න.

**(හිමිකම්පාන්නන් සඳහා පමණි)**

(පහත විලුව පිරවීමට පෙර තොරතුරු පද්ධතියේ ඇති ඔබ ලබාදුන් සංගණන තොරතුරු හොඳින් බලන්න)

| ප්‍රධාන මාතෘකා | දර්ශක අනු අංකය | නිවැරදි කර ඇතුළත් කරන තොරතුරු |
|---|---|---|
| 01. පවුල | | |
| 02. අධ්‍යාපනය | | |
| 03. සෞඛ්‍ය | | |
| 04. ආර්ථික සක්‍රිය | | |
| 05. සම්පත් පාලනය | | |
| 06. නිවාස තත්ත්වය | | |
| 07. [illegible] සහ ආශ්‍රිත ප්‍රශ්න | | |
| 08. පවුලේ ජන විකාශනය | | |

(විරෝධතාකරුවන් සඳහා පමණි)

1.7. විරෝධතාවය ඉදිරිපත් කරන්නේ කවුද යන වග... ?
(අදාළ පිළිතුර ඉදිරියේ ✓ ලකුණ යොදන්න)

| | |
|---|---|
| වැඩසටහනට ලියාපදිංචි වූ ඉල්ලුම්කරුවෙක් | |
| වෙනත් බාහිර පුද්ගලයෙක් | |

1.8. විරෝධතාවයට ලක්වන්නාගේ නම :-

1.9. විරෝධතාවයට ලක්වන්නාගේ ගෘහ ඒකක අංකය :-

1.10. විරෝධතාවයට ලක්වන්නාගේ ලිපිනය :-

2.1. විරෝධතාවය ඉදිරිපත් කරන්නේ කුමන කරුණුවලටද යන්න ඇතුළත් කරන්න.
(අදාළ පිළිතුර ඉදිරියේ ✓ ලකුණ යොදන්න)

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. | ආදායම් වියදම් පිළිබඳ | | 04. | පවුල | |
| 02. | වත්කම් පිළිබඳ | | 05. | වෙනත් කරුණක් | |
| 03. | නිවාස පිළිබඳ | | | | |

2.2. විරෝධතාවය පිළිබඳ වැඩි විස්තර මෙහි සඳහන් කරන්න.

(වචන 500 අඩුවෙන්)

ඉහත මා විසින් ඉදිරිපත්කර ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බව සහතික කරමි.

.............................................
අත්සන
(හිමිකම්පාන්නා/විරෝධතාකරු/පුරවැසි)

.............................................
දිනය

සභාපති/කොමසාරිස්
**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය**
01 මහල, නව ගොඩනැගිල්ල, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01.

ක්ෂණික ඇමතුම් | **1924**